
2019. 9. 26 අද



# ප්‍රතිපත්ති තීරණ, වෙළෙඳ පොළ ණය පොලී අනුපාත වෙත ගලායෑම කාර්යක්ෂම කිරීමක්

## - ශ්‍රී ලංකා මහ බැංකුව ණය පොලී අනුපාතිකවල ප්‍රවණතා අධීක්ෂණය කරයි



**ෂමිල පෙරේරා**

මෑතකාලීන ප්‍රතිපත්ති තීරණ වෙළෙඳ පොළ ණය පොලී අනුප්‍රාප්තික වෙත සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ණය පොලී අනුපාතිකවල ප්‍රවණතා අධීක්ෂණය කිරීමට කටයුතු කර තිබේ.

වෙළෙඳ පොළ පොලී අනුපාතිකවල පහළ යෑමක් ඇති කරවීම සඳහා පසුගිය මාස 11ක කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් හා නියාමන ප්‍රතිපත්ති ගණනාවක් ගත් බව සඳහන් කරන ඔවුන්, මෙම ක්‍රියාමාර්ග අතරට, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) පදනම් අංක 100කින් පියවර දෙකකින් අඩු කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම්වලට අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතකාංක 2.50කින් පහත දමමින් ඒ හරහා මූල්‍ය වෙළෙඳ පොළ වෙත රු.බිලියන 150ක පමණ අතිරික්ත ද්‍රවශීලතාවක් සැපයීම සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන මගින් පිරිනමනු ලබන රුපියල් තැන්පතු පොලී අනුපාතික මත සීමා පැනවීම මගින් එම ආයතනවල මහජන අරමුදල් රැස්කිරීමේ පිරිවැය පහළ දැමීම යනාදිය ඇතුළත් බව පෙන්වා දෙයි.

මනාව පදනම් වූ උද්ධමනය හා උද්ධමන අපේක්ෂා මධ්‍යයේ, ආර්ථික ක්‍රියාකාරකම්වලට සහයෝගය දැක්වීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ක්‍රියාමාර්ග ගත් බවත්, තවද, පාස්කු ඉරිදා සිදුවූ ප්‍රහාරයෙන් පසු ආර්ථිකයට ඇති වූ පසුබෑම සමග වෙළෙඳ පොළ ණය පොලී අනුපාතික පහළ දැමීමේ අවශ්‍යතාව තවදුරටත් තීව්‍ර වී ඇති බවත් මහ බැංකුව කියයි. එමෙන්ම, විවිධ සාධක හේතුකොට ගෙන මෙම වසර ආරම්භයේ සිට පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය තියුණු ලෙස පහළ ගොස් ඇති බව පෙන්වා දෙන මහ බැංකුව, අක්‍රීය ණය වර්ධනය වී ඇති බවද කියයි. එහිදී, ණය ප්‍රසාරණය මන්දගාමී වීම සහ අක්‍රීය ණය වැඩිවීම සඳහා ඉහළ මට්ටමේ පවතින නාමික සහ මූර්ත ණය පොලී අනුපාතික එක් ප්‍රධාන හේතුවක් වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස වී තිබේ. එමෙන්ම, සමාන ආර්ථිකයන් සමග සැසඳමේදී ශ්‍රී ලංකාවේ මූර්ත ණය පොලී අනුපාතික පිළිගත නොහැකි ඉහළ මට්ටමක පවතින බවත්, පසුගිය වසර 10 තුළ දී රට තුළ පැවති අඩු උද්ධමන වාතාවරණය මෙන්ම, යෝජිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමනය සියයට 4-6 පරාසයේ පවත්වා ගැනීමේ අපේක්ෂා සමගද අනුකූල නොවන බවද පෙන්වා දෙයි.

ඒ අනුව, මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරණ සංශෝධිත මුදල් නීති පනතේ 104 (1) (b) යන වගන්තිය යටතේ බලපත්‍රලාභී බැංකුවල රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතික, ඇතැම් බැහැර කිරීම්වලට යටත්ව, 2019 අප්‍රේල් මස 30 වැනි දින පැවති පොලී අනුපාතිකවලට සාපේක්ෂව 2019 ඔක්තෝබර් 15 වැනි දින වනවිට අවම වශයෙන් පදනම් අංක 200කින් අඩු කරන ලෙස නියම කර තිබේ.

එමෙන්ම, 2019 නොවැම්බර් 01 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි, ණයපත් (Credit Cards) සඳහා අදාළ උපරිම පොලී අනුපාතිකය වසරකට සියයට 28ක් වන අතර, පූර්ව අනුමත කරනලද තාවකාලික අයිරා (Temporary Overdrafts) සඳහා අදාළ වන උපරිම පොලී අනුපාතිකය වසරකට සියයට 24ක් වනු ඇති බවද මහ බැංකුව කියයි. එමෙන්ම, 2019 ඔක්තෝබර් 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, අනුමත ප්‍රමාණයන් ඉක්මවා යන හෝ හිඟ කාලසීමාවන්ට අදාළ හිඟ ගෙවීම් මත දණ්ඩන පොලී අනුපාතික වසරකට පදනම් අංක 400ක උපරිම සීමාවකට යටත් වනු ඇති බවද සඳහන් කරයි.

සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම එහි බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR), 2019 අප්‍රේල් මස 26 වැනිදා වාර්තා කරන ලද මට්ටමේ සිට 2019 දෙසැම්බර් මස 27 වැනි දින වනවිට පදනම් අංක 250කින් අඩුකරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, 2019 අප්‍රේල් මස 26 වැනි දින වාර්තා වූ අගයෙහි සිට අවම වශයෙන් පදනම් අංක 150කින් අඩුවිය යුතු බවද මහ බැංකුව පෙන්වා දෙයි.

ඒ අනුව, මූල්‍ය පද්ධතිය හරහා මුදල් ප්‍රතිපත්තිය වඩා කාර්යක්ෂමව සම්ප්‍රේෂණය වීම සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් වෙළෙඳ පොළ ණය පොලී අනුපාතිකවල ප්‍රවණතා අඛණ්ඩව අධීක්ෂණය කරනු ඇති බවත්, මෙම නියමය 2020 මාර්තු මස වනවිට නැවතත් සමාලෝචනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරන බවත් වැඩිදුරටත් අවධාරණය කරයි.